සැ. යු. — (i) 2015.09.04 දින පළ වූ අංක 1931 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI (ආ) කොටසේ 2015 වර්ෂය සඳහා කුරුණෑගල සහ කුලියාපිටිය අධිකරණ කලාපවලට අයත් ජූරි සභිකයින්ගේ නාමාවලියක් භාෂාත්‍රයෙන් පළවේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,932 - 2015 සැප්තැම්බර් මස 11 වැනි සිකුරාදා - 2015.09.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

	පිටුව		පිටුව
තනතුරු-ඇබෑර්තු	1246	පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ...	—
විභාග, විභාග ප්‍රතිඵල ආදිය	—	ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන	—
පළාත් පාලන නිවේදන	1248	අයවැය ලේඛන	—
අතුරු ව්‍යවස්ථා	—	දේපළ විකිණීම්	—
		විවිධ දැන්වීම්	1253

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය** පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ඔක්තෝබර් මස 02 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 සැප්තැම්බර් මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1245 - B 80983— 5,352 (2015/09)
F 9 –

තනතුරු - ඇබෑර්තු

මාතර මහ නගර සභාව

මාතර මහ නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුරු නාමය	*තනතුරු සංඛ්‍යාව*	*මාසික වැටුප් පරිමාණය*	*අවම අධ්‍යාපන සුදුසුකම්*
මෝටර් කාර්මික III ශ්‍රේණිය	1	රා.ප.ච. 6/2006 (iv) අනුව PL2-2006 A වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර	අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයක් (06) සමත්වී තිබිය යුතු ය. අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (N.V.Q) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබිය යුතු ය. අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.
පින්තාරුකරු (වාහන) III ශ්‍රේණිය	1	රා.ප. ච. 6/2006 (iv) අනුව PL -2-2006 A වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර	අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයක් (06) සමත් වී තිබිය යුතු ය. අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (N.V.Q) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබිය යුතු ය. අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.
ආදාහනාගාර ක්‍රියාකරු III ශ්‍රේණිය	1	රා.ප.ච. 6/2006 (iv) අනුව PL2-2006 A වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර	අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයක් (06) සමත් වී තිබිය යුතු ය. අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (N.V.Q) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබිය යුතු ය. අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.
කාර්යාල කාර්ය සහයක III ශ්‍රේණිය	1	රා.ප.ච. 6/2006 (iv) අනුව PL1-2006 A වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර	අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයන් හයක් (06) සමත් වී තිබිය යුතු ය.
ගස් කැපුම්කරු III ශ්‍රේණිය-	1	රා.ප.ච. 6/2006 (iv) අනුව PL1-2006 A වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර	අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයන් හයක් (06) සමත් වී තිබිය යුතු ය.

පොදු සුදුසුකම් :

(i) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතු ය ;

(ii) අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය. පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතු ය;

(iii) සෑම අපේක්ෂකයකුම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය ;

(iv) ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතු යි;

(v) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබුවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු ය.

බඳවා ගැනීමේ ක්‍රමය :

(i) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරාගනු ලබන අතර, එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු පදනම් කර ගනිමින් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය ;
(ii) වැන්දඹු හා අනත්දරු අරමුදලට දායකත්වය හිමි වේ;
(iii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම සහ හැසිරීම යහපත් තත්ත්වයේ සිටින සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ. එමෙන්ම වසර තුනක සේවා කාලය අවසන්වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය;
(iv) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතු ය.

ඉල්ලුම් කළ යුතු ආකාරය :

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පතක් 2015.09.30 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "නාගරික කොමසාරිස්, මහ නගර සභාව, මාතර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුයි. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම පූර්ණ බලතල මාතර මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ.

අයදුම්පත සමඟ පහත සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුයි :-

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතික,
(iii) පදිංචිය සහතික කිරීම පිණිස මෑතක දී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය. (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතු ය),
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්,
(v) පළපුරුද්ද පිළිබඳ සහතික,
(vi) මාතර මහ නගර සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්.

සේනක පල්ලියගුරුගේ,
නාගරික කොමසාරිස්,
මහ නගර සභාව - මාතර.

2015 ක් වූ අගෝස්තු මස 20 වැනි දින,
මහ නගර සභාව - මාතර.

09-245

පළාත් පාලන නිවේදන

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 37(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 37(1) "ආ" වගන්තිය ප්‍රකාරව, බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට මහ නගර සභාව විසින් මැන සළකුණු යොද ඇති මෙම මංමාවත සම්බන්ධයෙන් අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් විරුද්ධතාවයක් පළ කරන්නේ නම් මෙම නිවේදනයේ සිට එක් මසක් ඇතුළත එකී විරෝධතාවයන් ලිඛිතව ඉදිරිපත් කිරීමට ක්‍රියාකරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ශාන්තා පී. ලියනගේ,
නාගරික කොමසාරිස්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව.

2015 අගෝස්තු මස 27 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු. අංකය	පාරේ නම	මායිම් සීමාව සිට දක්වා	දිග	පළල
01	නුගේගොඩ පාගොඩ පාරේ අංක 12න් ආරම්භ වන අතුරු පාර	12, 12ඒ, 12සී, 121/1, 12/2,12/$2^{1/1}$, 12/1ඒ	127' 45'	12'සිට 16' දක්වා 15' සිට 20' දක්වා
02	පාගොඩ පළමු හරස් වීදිය හා දේවාල පටුමග සම්බන්ධ පාගොඩ පළමු හරස් වීදියේ වරිපනම් අංක 39/1බී දරන ස්ථානයේ සිට දේවාල පටුමගේ වරිපනම් අංක 23/31 ඒ දක්වා වූ අතුරු මාර්ගය	39/1බී, 39/1ඩී, 39/1ඊ, 39/2,39/3,39/5 23/31ඒ,23/31බී,23/31සී,23/31ඩී, 23/31ඊ, 23/31ජී, 23/31එච්, 23/31ජේ	150'	7' සිට 10' දක්වා
03	නුගේගොඩ ජම්බුගස්මුල්ල පාරේ වරිපනම් අංක 29, 29/ඒ, 29/1, 29බී 29සී නිවාසවලට යන මාර්ගය.	29,29ඒ,29බී, 29බී$^{1/1}$, 29සී, 29/1,29/1ඒ	187.6'	15'
04	මැද වැලිකඩ පළමු පටුමග අතුරු මාර්ගයේ අංක 83,$83^{1/1}$,83/1,83/$1^{1/1}$,83/1, 83/2, හා 85/2 යන නිවාසයන්ට පිවිසෙන මාර්ගය	83,$83^{1/1}$,83/1,83/$1^{1/1}$,83/1,83/2,85/2	152' 10"	9' 10" සිට 11' 2" දක්වා

09-242

බෝපේ - පෝද්දල ප්‍රාදේශීය සභාව

261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (ස්ම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ තුන්වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව විසින් 2015 අප්‍රේල් මස 21 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී පහත උපලේඛනයේ සඳහන් අංක 13 දරන යෝජනාව සම්මත කරන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. ඩී. ද සී. දසනායක,
ලේකම්,
බෝපේ - පෝද්දල ප්‍රාදේශීය සභාව.

2015 අගෝස්තු මස 11 වැනි දින,
බෝපේ - පෝද්දල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවග්නතියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු, 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පලාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තිය (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013.05.17 දින අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්ද වූ ද, දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද බව 2014.08.29 දින අංක 1878 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූ ද, සම්මත අතුරු ව්‍යවස්ථාවල I සිට XXIX දක්වා වූ කාණ්ඩ මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමට, ඉහත කී පළාත් පාලන ආයතනය (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ තුන්වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නීය.

09-123

කෑගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වැනි වගන්ති යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් 24(1) ආ වගන්තිය ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම මාවත් සළකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහා ද එම ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම් පාන යම් පාර්ශ්වයක් වේ නම් මෙම දැන්වීම පළ කල දින සිට මාස 03ක කාලයක් තුළ එම ඉඩමට ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයෙහි නඩුව පවරා විරෝධතා ඉදිරිපත් කළ යුතු බව ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සජීවනී මැණික් වික්‍රමසූරිය,
ලේකම්,
කෑගල්ල ප්‍රාදේශීය සභාව,
බුළුරුප්ප, හෙට්ටිමුල්ල.

උපලේඛනය

පාරේ නම : මිල්ලගහමුල කඩය අසළ සිට ගල්ලෙන්වත්ත දක්වා වූ මාර්ගය
වසම : බෙලිහුල්වාන
දිග : මීටර් 210
පළල : මීටර් 3.125

පාරේ දකුණු පස		*පාරේ වම්පස*	
01.	පී. ජයසූරිය	1.	පී. සරත් ජයසිංහ බණ්ඩාර
02.	ජී. ජේ. විමලසේන		
03.	ජී. ප්‍රේමතිලක		
04.	ටී. ධර්මසේන		
05.	ටී. චන්ද්‍රසේන		
06.	පී. නිමල් වීරසිංහ		

මිල්ලගහමුල කඩය අසල සිට ගල්ලෙන්වත්ත දක්වා වූ මාර්ගය.

P.P.C. Jayasena (MSI)
Licensed Surveyor , Leveller
& Court Commissioner
Higgoda
Undugoda
Telephone No: 035-2278728
LSC Reg. No. 19991017

Plan No :2014/P/132



Reference:-
ST- Stake
Road (PS) - Road Pradeseeya Sabha

සැබෑ පිටපතකි.
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

Scale :- 1:1000

PLAN

Shown ,The Road, From Near Millagahamula to Gallen Waththa Road
Situated at Nikapitiya Village (in No 58 C Belahulwana GS Division of
Kegalle Secretariat Division within Pradeseeya Sabha Area of Kegalla) in
Kanduaha Paththu of Paranakuru Korale
Kegalle District

SABARAGAMUWA PROVINCE

Bounded as described above

Length of the Road	210 M	672 ft.
Width of Road	3.125 M	10 ft.

Date of Survey:- 2014.10.21

Licensed Surveyor
2014.10.23

P.P.C. Jayasena
Registered Licensed

FB 2063 1754

පාරේ නම : මිනුවන්ගමුව හපුගහමුලහේන මාර්ගය
වසම : මිනුවන්ගමුව
දිග : මීටර් 168.5
පළල : මීටර් 3

පාරේ දකුණු පස	පාරේ වම්පස
එම්. ඒ. එස්. බාලසූරිය - තැන්නහේන කැබලි අංක 06	රජයේ බෙහෙත් ශාලාව
එම්. එම්. රේණුකා කුමාරි - තැන්නහේන කැබලි අංක 05	කේ. ඒ. කාලින්ද - හපුගහමුලහේන
ඩබ්ලිව්. එම්. සුමිත්‍රා මැණිකේ - වල්පොලවත්ත	කේ. ඒ. විජේසිංහ- හපුගහමුලහේන
ජී. ටී. ධර්මකුලසූරිය - වල්පොලවත්ත	
ඒ. ඒ. හීන්මැණිකේ - හපුගහමුලහේන	
කේ. ඒ. මහින්ද - හපුගහමුලහේන	



පාරේ නම : ගොඩපල නිසංසල මාවත
වසම : බුළුරුප්ප
දිග : මීටර් 124
පළල : මීටර් 3.03

පාරේ දකුණු පස

ඩී. පී. ජයසිංහ - ගොඩපල, හෙට්ටිමුල්ල
එච්. සමන් අශෝක - ගොඩපල, හෙට්ටිමුල්ල
එම්. ඒ. එස්. පී. මල්ලිකාආරච්චි - ගොඩපල, හෙට්ටිමුල්ල
කේ. ඒ. සුගතදස - ගොඩපල, හෙට්ටිමුල්ල
ඩී. එල්. විමලරත්න - ගොඩපල, හෙට්ටිමුල්ල

පාරේ වම්පස

ඩී. පී. ජයසිංහ - ගොඩපල, හෙට්ටිමුල්ල
එච්. සමන් අශෝක - ගොඩපල, හෙට්ටිමුල්ල
එම්. ඒ.එස්. පී.මල්ලිකාආරච්චි - ගොඩපල, හෙට්ටිමුල්ල
කේ. ඒ. සුගතදස - ගොඩපල, හෙට්ටිමුල්ල
ඩී, එල්. වික්‍රමරත්න - ගොඩපල, හෙට්ටිමුල්ල.



විවිධ දැන්වීම්

ගලිගමුව ප්‍රාදේශීය සභාව

2016 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය යටතේ පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණයන් අනුව වාහන සහ සතුන් පිළිබඳ බද්දක් 2016 වර්ෂය සඳහා නියමකර අයකිරීමට අදාළ පහත යෝජනාව 2015.07.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේදී සභා සම්මත වූ බවත් 148(3) වැනි වගන්තිය යටතේ මෙම බදු මුදල 2016 මාර්තු 31 වැනි දිනට පෙර ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුනේත්‍රා සමරසිංහ,
ලේකම්,
ගලිගමුව ප්‍රාදේශීය සභාව

මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය යටතේ පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණයන් අනුව වාහන සහ සතුන් පිළිබඳ බද්දක් 2016 වර්ෂය සඳහා පනවා අයකිරීමට යෝජනා කරන්නීය.

2015 අගෝස්තු මස 25 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

		රු. ශ.
01.	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	25 0
02.	සෑම බයිසිකලයක් (පාපැදියක්) සඳහාම	
	(අ) වෙළඳ කාර්යයක් සඳහා වන්නේ නම්	18 0
	(ආ) වෙළඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4 0
03.	සෑම කරත්තයක් සඳහාම	20 0
04.	සෑම අත්කරත්තයක් සඳහාම	10 0
05.	සෑම අශ්වයෙකු හෝ පෝනියෙකු හෝ කොටළුවකු සඳහා	15 0
06.	සෑම ඇතෙකු හෝ අලියෙකු සඳහා	50 0
07.	සෑම රික්සෝවක් සඳහා	7 50
08.	ත්‍රී රෝද රථයක් සඳහා (මසකට)	50 0

09-247/10

ගලිගමුව ප්‍රාදේශීය සභාව

2016 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වැනි වගන්ති ප්‍රකාර ගලිගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු අය නොකරන ප්‍රදේශ වල පිහිටියා වූ ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ ඉඩම්වලින් පහත උපලේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් යුතු අක්කර බද්දක් 2016 වර්ෂය සඳහා පැනවීමට අදාළ පහත යෝජනාව 2015.07.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්තිකාරක සභාවේදී සභා සම්මත වූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

තවද එකී බද්ද 2016 වර්ෂයට පනවා 2016 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන අයුරු කාර්තු (4)කින් අයකර ගැනීමට තීරණය කර ඇති බවත්, එකී කාර්තු අවසන් වීමට පෙර එම බද්ද ගෙවිය යුතු බවත් දැනුම් දෙනු ලැබේ.

සුනේත්‍රා සමරසිංහ,
ලේකම්,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2015 අගෝස්තු මස 25 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.
F2 - B80983

මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා යෝජනාව

ගලිගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වරිපනම් බදු අය නොකරන ප්‍රදේශවල පිහිටියා වූ ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ ඉඩම්වලින් පහත උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන්ගෙන් යුතු අක්කර බද්දක් 2016 වර්ෂය සඳහා පනවා අය කිරීමට යෝජනා කරන්නීය.

උපලේඛනය

01.	හෙක්ටයාර් 05ට අඩු නමුත් හෙක්ටයාර් 01 ට වැඩි අවස්ථාවක	- රු. 50
02.	හෙක්ටයාර් 05ක් හෝ ඊට වැඩි සෑම අවස්ථාවක හෙක්ටයාර් 01ට	- රු. 10 බැගින්

09-247/9

ගලිගමුව ප්‍රාදේශීය සභාව

2016 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වැනි සහ 134(2) වැනි වගන්ති ප්‍රකාර ගලිගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු ගම් ප්‍රදේශයන් වශයෙන් ප්‍රකාශයට පත් කොට ඇති කොටසේ පිහිටි,

(අ) සියළුම ගෘහස්ථ, කෘෂිකාර්මික හා ව්‍යාපාරික නොවන අනෙකුත් දේපළවලට වාර්ෂික තක්සේරු වටිනාකමින් 4%ක වරිපනම් බද්දක් හා,

(ආ) ව්‍යාපාරික හා රජයේ දේපළවල වාර්ෂික වටිනාකමින් 4.5%ක වරිපනම් බද්දක්, 2016 වර්ෂය සඳහා පනවා, 2016 මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 වැනිදායින් අවසන් වන අයුරු කාර්තු 4කින් අයකරගැනීමට තීරණය කරන ලද බවත්, එකී කාර්තුවක් අවසාන වීමට පෙර ගෙවිය යුතු බවටත්,

අදාළ පහත යෝජනාව 2015 ජූලි මස 29 වැනි දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේදී සභා සම්මත වූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

තවද -

(අ) 2016 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම සම්පූර්ණ වර්ෂයකට ගෙවිය යුතු වරිපනම් බද්ද ගෙවනු ලැබුවහොත්, ගෙවන ලද මුදලින් (10%) සියයට දහයක වට්ටමක් ද,

(ආ) වරිපනම් බදු මුදල කොටස් වශයෙන් ගෙවන විට වරිපනම් බද්ද ගෙවිය යුතු කාර්තුවේ පළමුවැනි මාසය තුළ ගෙවනු ලැබුවහොත් එසේ ගෙවන මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද, බදු ගෙවන්නන්ට දෙනු ලබන අතර, නියමිත කාලසීමාව ඉක්මවා වරිපනම් බදු ගෙවනු ලබන අයගෙන් සියයට දහයක (10%) අධි ගාස්තුවක් ද අයකරනු ලබන බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුනේත්‍රා සමරසිංහ,
ලේකම්,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2015 අගෝස්තු මස 25 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා යෝජනාව

සියලුම ගෘහස්ථ, කෘෂිකාර්මික හා ව්‍යාපාරික නොවන අනෙකුත් දේපලවලට වාර්ෂික තක්සේරු වටිනාකමින් 4%ක වරිපනම් බද්දක්, හා ව්‍යාපාරික හා රජයේ දේපලවලට වාර්ෂික වටිනාකමින් 4.5%ක වරිපනම් බද්දක් ද, 2016 වර්ෂය සඳහා පනවා අය කිරීමට යෝජනා කරන්නීය.

09-247/8

ගලිගමුව ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 සහ 150 වගන්ති යටතේ පැවරී ඇති බලතල අනුව ගලිගමුව ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පහත සඳහන් උපලේඛනවල දැක්වෙන බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු, 2016 වර්ෂය සඳහා පැනවීමට අදාළ පහත යෝජනාව 2015.07.29 දින පැවති මුදල්

හා ප්‍රතිපත්ති කාරක සභාවේදී සම්මත වූ බවත්, එකී බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු සෑම වර්ෂයකම මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් දනුම් දෙනු ලැබේ. තවද රජය විසින් වරින් වර පවරනු ලබන බදු වලටද යටත් වනු ඇත.

සුනේත්‍රා සමරසිංහ,
ලේකම්,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 සහ 150 වගන්ති යටතේ පැවරී ඇති බලතල අනුව ගලිගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත සඳහන් උපලේඛනවල දැක්වෙන බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු 2016 වර්ෂය සඳහා පනවා අය කිරීමට යෝජනා කරන්නීය.

2015 අගෝස්තු මස 25 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය යටතේ පැනවෙන බලපත්‍ර ගාස්තු

අංක 1 උපලේඛනය - සාමාන්‍ය ව්‍යාපාර

	ව්‍යාපාරයේ ස්වභාවය	*බලපත්‍ර ගාස්තුව* *වාර්ෂික වටිනාකම රු. 750ට නොවැඩි*	*වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි රු. 1,500 ට අඩු*	*වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	තේ කඩයක් හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම	350 0	550 0	800 0
03.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	භෝජනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	ලැගුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	350 0	550 0	850 0
09.	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම			
	(ඒ) එක් අයෙකු සේවය කරන ස්ථානයකට	400 0	600 0	850 0
	(බී) එක් අයෙකුට වැඩිය සේවය කරන ස්ථානයක්	500 0	750 0	1,000 0
10.	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (සභාවෙන් වෙළඳ අයිතිය බදු දෙන ලද)	500 0	750 0	1,000 0
11.	ගවමස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (සභාවෙන් වෙළඳ අයිතිය බදු දෙන ලද)	500 0	750 0	1,000 0
12.	කුකුල් මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (සභාවෙන් වෙළඳ අයිතිය බදු දෙන ලද)	500 0	750 0	1,000 0
13.	උත්සව ශාලාවක් පවත්වාගෙන යාම (රෙස්ටුරන්ට්)	500 0	750 0	1,000 0
14.	උත්සව සඳහා ආහාර සැපයීම (කේටරින් සර්විස්)	500 0	750 0	1,000 0
15.	ආගන්තුක නිවාසයක් පවත්වාගෙන යාම (ගෙස්ට් හවුස්)	500 0	750 0	1,000 0
16.	අයිස් ක්‍රීම්, යෝගට් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	රසකැවිලි වර්ග සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	ශීතකළ කුකුල් මස්, මාළු, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම(පිළිගත් ආයතනයක ඇසුරුම්)	500 0	750 0	1,000 0
19.	කිරි පට්ටියක් පවත්වාගෙන යාම -			
	දෙනුන් 5 ට වැඩි 10 ට නොවැඩි	600 0	800 0	400 0
	දෙනුන් 10 ට වැඩි 20 ට නොවැඩි	400 0	700 0	900 0
	දෙනුන් 20 ට වැඩි වූ විට	500 0	750 0	1,000 0
20.	කැඳ හෝ සුප් වර්ග, ආයුර්වේද කෑම වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300 0	500 0	750 0
21.	සිසිල්බීම විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	700 0	900 0
22.	සංචාරක මාළු වෙළඳාම	500 0	750 0	1,000 0
23.	ග්‍රොසරියක් පවත්වාගෙන යාම (කිරි ආහාර, ටින් කෑම සබන් වර්ග විකිණීම)	500 0	750 0	1,000 0
24.	පපඩම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	තේ කුඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	650 0	900 0

ව්‍යාපාරයේ ස්වභාවය	බලපත්‍ර ගාස්තුව වාර්ෂික වටිනාකම රු. 750ට නොවැඩි	 වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි රු. 1,500 ට අඩු	 වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි
	රු. ශත	රු. ශත	රු. ශත
26. සුරුට්ටු හෝ බීඩි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27. සංචාරක වෙළඳාම (රටකජු, කඩල, ස්වීට් කෑම, කෙටි කෑම, තේ කුඩු පැකට්, කුළුබඩු පැකට්, නිල් පැකට් විකිණීම)	500 0	750 0	1,000 0
28. කිරිපිටි වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300 0	500 0	750 0
29. චොක්ලට් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම			

අංක 2 උපලේඛනය - අන්තරායදායක ව්‍යාපාර

1. කබොක්, බොරළු, හෝ කළු ගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2. යන්ත්‍රානුසාරයෙන් කළු ගල් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3. ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4. සිසිල් බීම වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5. කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හා ගබඩා කිරීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6. ගැලුම් 50ට වැඩි පොල්තෙල් ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7. පොල් කටු ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	200 0	400 0	600 0
8. විසිරි පින්තාරු කිරීමේ (ස්ප්‍රේ ප්‍රේන්ටින්) ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9. පාවිච්චි කරන ලද පත්‍ර, කඩදාසි ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	600 0	800 0
10. විදුලිය බලයෙන් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11. අත්යන්ත්‍ර මගින් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	400 0	600 0	750 0
12. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන ලී ඉරුම් හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13. අතින් ලී ඉරන ඉරුම් හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14. යාන්ත්‍රික වඩුමඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15. ගෘහ භාණ්ඩ නිපදවීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16. වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17. යාන්ත්‍රික රෙදි විවීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18. අත් යන්ත්‍ර මගින් රෙදි විවීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	400 0	500 0	700 0
19. සේද රෙදි විවීම හා විසිතුරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	500 0	700 0
20. ලොරි බොඩි ගැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21. පවිත්‍රතා සඳහා සේවකයින් සැපයීම	500 0	750 0	1,000 0
22. දුරකථන කුළුණු සඳහා සේවාවන් සැපයීම	500 0	750 0	1,000 0

අංක 3 උපලේඛනය - අප්‍රසන්න ව්‍යාපාර

1. මිනිරන් ශුද්ධ කිරීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2. පොහොර, රසායනික පොහොර නිෂ්පාදනය කිරීමේ හෝ ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3. හම් පදම් කිරීම හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4. කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් කොටුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5. ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6. කුකුල්, තාරා ආදී සජීවී සතුන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	650 0	800 0
7. රබර් නිෂ්පාදනය කිරීමේ හා ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්මලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9. යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන කම්මලක් පවත්වාගෙන යාම	400 0	700 0	900 0
10. පාපැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	700 0	900 0
11. මෝටර් බයිසිකල් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12. ටයර් ටියුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13. සත්ත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14. සබන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15. අලුත් හෝ පරණ ලෝහ/ලෝහමය සුන්බුන් ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	ව්‍යාපාරයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 750ට නොවැඩි	වාර්ෂික වටිනාකම රු. 750ට වැඩි එහෙත් රු. 1,500ට අඩු	වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි
		රු. ශත	රු. ශත	රු. ශත
16.	සිරප්/පළතුරු බීම වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	පොල් ලෙලි හෝ දැව පල් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	ඇසිඩ් වර්ග නිපදවීමේ හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	විනාකිරි නිපදවීමේ හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300 0	500 0	700 0
20.	පැණි/හකුරු නිපදවීමේ හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300 0	500 0	700 0
21.	පින්තාරු තීන්ත, වාර්නිෂ් තීන්ත හෝ ඩිස්ටැම්පර් සායම් නිපදවීමේ හෝ හොණ්ඩර 05කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	ලැලි පදම් කිරීමේ හෝ සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	පළතුරු, මාළු හෝ වෙනත් කෑම වර්ග ටින්/බෝතල්වල ඇසිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	ලියන තීන්ත, අච්චු තීන්ත, ස්ටෙන්සිල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	කපාපු පොල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	ගඩොල් හෝ උළු ගබඩාකර තබාගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	ආයුර්වේද බෙහෙත් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍ය නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අංක 4 උපලේඛනය - අන්තරායදායක සහ අප්‍රසන්න ව්‍යාපාර

1.	ඩ්‍රයික්ලීන් කරන හෝ රෙදි මුද්‍රණය හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යාම	350 0	550 0	800 0
2.	ගිණිකෙළි භාණ්ඩ, රතිඤ්ඤා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300 0	500 0	750 0
3.	හොණ්ඩර 03ට වැඩියෙන් තේ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	බැටරි චාර්ජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300 0	500 0	750 0
5.	වැල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	වඩු මඩුවක් පවත්වාගෙන යාම	450 0	650 0	850 0
8.	ලියවන පට්ටල් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	මෝටර් රථ ආමිචර් එතීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ගල් ස්මාරක නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	පෙට්‍රල්, ඩීසල් නිකුත් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	මෝටර් රථ අමතර කොටස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	පොලිෂ් හෝ ඉටි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	පොලිතීන් බෑග් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
16.	වැලි ගොඩ දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	විෂබීජනාශක ද්‍රව්‍ය නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	ලී බඩු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	650 0	850 0
19.	රබර් මුදවන ස්ථානයක් (රබර් රෝල හා දුම්කාමරයක්) පවත්වාගෙන යාම	350 0	550 0	800 0
20.	රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	රබර් මිශ්‍ර මෙට්ට, රෙදි වර්ග හා වෙනත් උපකරණ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	යකඩ තහඩු ගැල්වනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	ප්ලාස්ටික් බඩු, සෙල්ලම් බඩු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	බාල්දි හා වෙනත් තහඩු උපකරණ නිපදවීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
26.	යන්ත්‍ර උපකරණ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	විදුලි උපකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	පරණ යකඩ බඩු ගබඩා කිරීමේ හෝ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	350 0	550 0	800 0
29.	කොහු හෝ වෙනත් කෙඳිවලින් උපකරණ හෝ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	600 0	800 0

	ව්‍යාපාරයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750ට නොවැඩි*	*වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි රු. 1,500 ට අඩු*	*වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
30.	අයිස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප කණු, සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	සම්භාණ්ඩ නිපදවීමේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	ටයර් කට්ට කැපීම හෝ පිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	යන්ත්‍රානුසාරයෙන් පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	400 0	600 0	800 0
36.	මැණික් ගල් කැපීමේ හා ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	ඉටිපන්දම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	රූපවාහිනී, ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	වී මෝලක් පවත්වාගෙන යාම -			
	අශ්ව බල 5-10 දක්වා	500 0	750 0	1,000 0
	අශ්ව බල 11-21 දක්වා	500 0	750 0	1,000 0
40.	මිරිස් කුඩු, කුළු බඩු වර්ග, ධාන්‍ය වර්ග ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	600 0	800 0
41.	පොල් තෙල් සිඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	කොහු මෝලක් හෝ කොහු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	600 0	800 0
43.	පොල් ලී මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	රථ වාහන ආසන (කුෂන්) වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	ආනයනය කරන දැව වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	ඩිස්පෙන්සරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48.	ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම	400 0	600 0	850 0

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ පැනවෙන ඇතැම් ව්‍යාපාර බදු

1.	සුළු අපනයන භෝග මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	ඇඳුම් මැසීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	350 0	550 0	750 0
3.	රෙදිපිළි සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	සාප්පු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	ස්වර්ණාභරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	ඇළුමිනියම් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300 0	400 0	600 0
8.	ලී බඩු වෙළඳ සැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	පාවහන්/බෑග් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ගෑස් සිලින්ඩර් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	650 0	800 0
12.	මෝටර් රථ, මෝටර් බයිසිකල් අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	අවමංගල භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	මංගල භාණ්ඩ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	මහන මැෂින් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	බයිසිකල් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ලිපිද්‍රව්‍ය, පොත්, සඟරා, පුවත්පත් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300 0	500 0	750 0
18.	මැටි භාණ්ඩ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	350 0	550 0	800 0
19.	විදුලි උපකරණ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	දත් බැඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	350 0	550 0	800 0
21.	කාපට්, කාපට් පටි අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	300 0	500 0	750 0
22.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	ක්ෂණික ඡායාපිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	600 0	800 0
24.	දේශීය, විදේශීය දුරකථන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	350 0	550 0	800 0

	ව්‍යාපාරයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 750ට නොවැඩි රු. ශත	වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි රු. 1,500 ට අඩු රු. ශත	වාර්ෂික වටිනාකම රු. 1,500ට වැඩි රු. ශත
25.	පටිගත කිරීම, වීඩියෝ පටි, කැසට් පටි විකිණීමේ ස්ථානයක්	300 0	500 0	750 0
26.	ඉදල්, කොහු භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300 0	500 0	800 0
27.	පින්තූර රාමු කරන හෝ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	300 0	500 0	750 0
28.	වීදුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	ලොතරැයි ටිකට් පත් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	300 0	500 0	750 0
30.	ගම් වර්ග ගබඩාකර විකිණීම හෝ සංචාරක වෙළඳාම	450 0	650 0	850 0
31.	තුනී ලෑලි වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	ඩිජිටල් ප්‍රින්ටින් ස්ටිකර් මුද්‍රණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	350 0	450 0	650 0
33.	කෘතිම මල්, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	500 0	700 0
34.	පිත්තල භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	පොලිතින් බෑග් හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	350 0	450 0	650 0
36.	විසිතුරු මල්පැල විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	500 0	750 0
37.	විසිතුරු භාණ්ඩ/ආභරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	350 0	500 0	750 0
38.	ප්ලාස්ටික් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	500 0	750 0
39.	සෙල්ලම් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	500 0	750 0
40.	සිල්ලර බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	කුළුබඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300 0	500 0	750 0
42.	වේවැල් භාණ්ඩ සෑදීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	600 0	800 0
43.	බුලත් දුම්කොළ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	මත්පැන් (රටබීම) විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	ඉංග්‍රීසි බෙහෙත් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	මනාලියන් හැඩගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	බුරුසු වර්ග නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	300 0	500 0	750 0
48.	දැව/දර ගබඩාවක් පවත්වාගෙන යාම	300 0	600 0	800 0
49.	තාවකාලික කුටිවල කුමන හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම (දිනකට ගාස්තුව)	200 0	300 0	500 0
50.	ජංගම වෙළඳාම (බේකරි නිෂ්පාදන/තොග බඩු අලෙවිය)	500 0	750 0	1,000 0

09-247/1

ගලිගමුව ප්‍රාදේශීය සභාව

ගොඩනැගිලි ඉදිකිරීම් මත ගාස්තු අයකිරීම - 2016 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 31 සහ 78 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාර, 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන අති විශෙෂ ගැසට් පත්‍රයේ (IV) ආ කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව, ගලිගමුව ප්‍රාදේශීය සභාවේ යෝජනාවලින් අනුමත (269 වන අධිකාරය වන) නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාර, 2016.01.01 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි ගලිගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම හා අනවසර ඉදිකිරීම් සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු අය කිරීමට අදාළ පහත යෝජනාව 2015.07.29 දින පැවති මහා සභාවේ දී සභා සම්මත වූ බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. තව ද ගලිගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කරනු ලබන සියළුම ඉදිකිරීම් සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් අයදුම්පතක් ගලිගමුව ප්‍රාදේශීය සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු බව මෙයින් වැඩිදුරටත් දන්වා සිටිමි.

සුනේත්‍රා සමරසිංහ,
ලේකම්,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා යෝජනාව

නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාර, 2013.10.29 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි ගලිගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ 2016 වර්ෂයේ දී ගොඩනැගිලි ඉදිකිරීම හා අනවසර ඉදිකිරීම් සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු පනවා අය කිරීමට යෝජනා කරන්නී ය.

උපලේඛනය 01

පෙරසැරි ගාස්තු	*රු. ශත*
වීථි රේඛා සඳහා	500 0
එම පෝරම ගාස්තු	125 0
ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු	940 0

උපලේඛනය 02

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට අනුව හා 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතට අනුව පෙරසැරි ගාස්තු අයකිරීම

ගෙබිම විශාලත්වය වර්ග මීටර්වලින්	*පදිංචිය සඳහා* *රු. ශත*	*වානිජ හෝ වෙනත් ස්ථාන* *රු. ශත*
45ට අඩු	500 00	1,000 00
45-90	1,500 00	2,000 00
91-180	2,500 00	3,000 00
181-270	3,500 00	4,000 00
271-450	4,500 00	6,000 00
451-675	5,500 00	8,000 00
676-900	6,500 00	10,000 00
901-1225	7,500 00	12,000 00
1225ට වැඩි	7,500 00	12,000 00
	වර්ග මීටර් 1226 ඉක්ම වීමෙන් පසු සෑම වර්ග මීටර් 90ක් සඳහාම රු. 1000.00 බැගින්	වර්ග මීටර් 1226 ඉක්ම වීමෙන් පසු සෑම වර්ග මීටර් 90ක් සඳහාම රු. 1250.00 බැගින්

උපලේඛන අංක 03

අවසර නොගෙන යම් ඉදිකිරීමක් සිදුකරන්නේ නම්
ඉදිකරන ලද ගොඩනැගිල්ලෙහි වර්ග අඩි 01ක් සඳහා රු. 20.0 බැගින් හා වහලය දක්වා වර්ග අඩි 01ක් සඳහා රු. 40.0 බැගින් අයකරනු ලැබේ.

09-247/4

ගලිගමුව ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම / දෘෂ්‍ය පරිසර - ගාස්තු අය කිරීම - 2016 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 221 (අ) හා 122 - 126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 1986.08.23 වැනි දින අංක 520/5 දරන පළාත් පාලන අති විශෙෂ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසෙහි ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව, 1991.01.11 වැනි දින අංක 645 දරන ගැසට් පත්‍රයේ නිවේදනයක් මගින් ගලිගමුව ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් පාරකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2016 වර්ෂයේ සිට අයකිරීමට අදාළ පහත යෝජනාව 2015.07.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ දී සභා සම්මත වූ බව, ප්‍රකාශයට පත් කරමි.

සුනේත්‍රා සමරසිංහ,
ලේකම්,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2015 අගෝස්තු මස 25 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා යෝජනාව

ගලිගමුව ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් පාරකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2016 වර්ෂයේ සිට පනවා අය කිරීමට යෝජනා කරන්නී ය.

		මසකට හෝ මසකට වැඩි කොටසක් සඳහා *රු. ශත.*	*වර්ෂයකට* *රු. ශත.*
(01)	වේදිකා නාට්‍යයක් හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් නොවන වෙනත් ප්‍රසංගයක් පිළිබඳව බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කෙරෙන ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට හෝ ඉන් කොටසකට	5.00	25.00
(02)	සිනමා ලේඛික ප්‍රසංගයක් හෝ වේදිකා නාට්‍යයක් පිළිබඳව බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන දැන්වීමක් සඳහා වර්ග අඩියකට හෝ ඉන් කොටසකට	5.00	35.00

		මසකට හෝ මසකට වැඩි කොටසක් සඳහා රු. ශ.	වර්ෂයකට රු. ශ.
(03)	සිනමා ලේඛික ප්‍රසංගයක් හෝ වේදිකා නාට්‍යයක් පිළිබඳව බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රදීප්ත ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට හෝ ඉන් කොටසකට	5.50	5.00
(04)	සිනමා ලේඛික ප්‍රසංගයක් හෝ වෙනත් යම් ප්‍රසංගයක් සම්බන්ධ ප්‍රචාරක දැන්වීමක් නොවන්නාවූ ද, බිත්තියක හෝ දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනය කර ඇත්තාවූ ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට හෝ ඉන් කොටසකට	2.50	5.00
(05)	සිනමා ලේඛික ප්‍රසංගයක් සම්බන්ධ ප්‍රචාරක දැන්වීමක් නොවන ප්‍රදීප්ත ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට හෝ ඉන් කොටසකට	3.00	30.00
(06)	යම් පුවරුවක හෝ ආධාරකයක ප්‍රදර්ශනය කෙරෙන්නා වූ නැතහොත් ධාවනය වන වාහනයකට සවිකර ඇත්තා වූ ප්‍රචාරක දැන්වීමක් සඳහා	10.00	100.00

09-247/3

ගලිගමුව ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව මෙහි පහත දැක්වෙන I වැනි උපලේඛනයේ සඳහන් ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා II වැනි උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණයන්ට අනුකූලව වාර්ෂික බද්දක් 2016 වර්ෂය සඳහා සහ ඉන්පසු එළඹෙන වර්ෂ වෙනුවෙන් පැනවීමට, අදාළ පහත යෝජනාව 2015.08.19 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ දී සභා සම්මත වූ බවත්, එම බද්ද සෑම වර්ෂයකම මාර්තු මාසයේ 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව ගලිගමුව ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත දැක්වෙන I වැනි උපලේඛනයේ සඳහන් ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා II වැනි උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණයන්ට අනුකූලව වාර්ෂික බද්දක් 2016 වර්ෂය සඳහා සහ ඉන්පසු එළඹෙන වර්ෂ වෙනුවෙන් පනවා අයකිරීමට යෝජනා කරන්නීය.

සුනේත්‍රා සමරසිංහ,
ලේකම්,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2015 අගෝස්තු මස 25 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

I වැනි උපලේඛනය

1. වෙන්දේසිකරුවෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
2. බ්‍රෝකර්වරයෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
3. මුදල් ණයට දෙන්නකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
4. කොන්ත්‍රාත්කරුවෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
5. උකස් කරුවෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
6. ගණන් පරීක්ෂකවරයෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙනයාම
7. ගෘහ නිර්මාණ ශිල්පියෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙනයාම
8. සැපයුම්කරුවෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
9. රක්ෂණ නියෝජිතයෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
10. ලොතරැයි නියෝජිතයෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
11. ප්‍රවාහන නියෝජිතයෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
12. පෞද්ගලික අධ්‍යාපනික පංති පවත්වන්නකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
13. මිනින්දෝරුවෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
14. නොතාරිස්වරයෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
15. කුලීරථ ධාවකයෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
16. රියදුරු පුහුණු කරවන්නකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙනයාම
17. ඉන්ධන පිරවුම්හල් නියෝජිතයෙකු ලෙස වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
18. මැණික් හෝ මිනිරන් කැණීමේ හෝ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
19. බැංකු හා මූල්‍ය ආයතනයක් පවත්වාගෙන යාම
20. රක්ෂණ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
21. විදේශ රැකියා ඒජන්සි ආයතනයක් පවත්වාගෙන යාම

22. බැංකු හා මුල්‍ය ආයතනයක් පවත්වාගෙන යාම
23. නීතිඥවරයෙකු ලෙස ආයතනයක් පවත්වාගෙන යාම
24. පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
25. සිගරට් හෝ බීඩි වෙළඳ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
26. තේ හෝ රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
27. ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
28. රථ වාහන අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
29. බලවේග මගින් රෙදි විවීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
30. සමූපකාර ප්‍රාදේශික පවත්වාගෙන යාම
31. රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
32. පතල් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
33. යෝගට් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
34. ජල විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම
35. ප්‍රජා ජලව්‍යාපෘතියක් පවත්වාගෙන යාම

II වැනි උපලේඛනය

	බදු ගෙවිය යුතු වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයේ ආදායම	*ආදායම අනුව නියමිත වාර්ෂික බද්ද රු. ශත*
(i)	රු. 6,000 නොක්මවන අවස්ථාවක	අය නොකරයි
(ii)	රු. 6,000 ඉක්මවූවත් රු. 12,000 නොඉක්මවන විට	90.00
(iii)	රු. 12,000 ඉක්මවූවත් රු. 18,750 නොඉක්මවන විට	180.00
(iv)	රු. 18,750 ඉක්මවූවත් රු. 75,000 නොඉක්මවන විට	360.00
(v)	රු. 75,000 ඉක්මවූවත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200.00
(vi)	රු. 1,50,000 ඉක්මවන විට	3,000.00

09-247/2

ගලිගමුව ප්‍රාදේශීය සභාව

ඉඩම් විකිණීම මත බදු අයකිරීම - 2016

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වැනි වගන්තිය යටතේ ගලිගමුව ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැවුකරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් 1%කට සමාන බද්දක් විකුණුම්කරු හෝ ඒ වෙන්දේසිකරු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් හෝ එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් ගලිගමුව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්, විකුණුම් ඉඩමේ වාසස්ථාන ඉදි කිරීමේ දී වෙන්දේසි ඉඩමේ අක්කර ප්‍රමාණය අනුව පොදු පහසුකම සඳහා ද අදළ ඉඩමේ ප්‍රමාණය වෙන්කල යුතු බවටත් අදාළ පහත යෝජනාව 2015.07.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ දී සභා සම්මත වූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුනේත්‍රා සමරසිංහ,
ලේකම්,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2015 අගෝස්තු මස 25 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා යෝජනාව

ගලිගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැවුකරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් 1%කට සමාන බද්දක් 2016.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විකුණුම්කරු හෝ ඒ වෙන්දේසිකරු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුනියෝජිතයා විසින් හෝ එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් ගලිගමුව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්, විකුණුම් ඉඩමේ වාසස්ථාන ඉදිකිරීමේ දී වෙන්දේසි ඉඩමේ අක්කර ප්‍රමාණය අනුව පොදු පහසුකම් සඳහා ද අදළ ඉඩම් ප්‍රමාණය වෙන් කළ යුතු බවටත් යෝජනා කරන්නී ය.

09-247/6

ගලිගමුව ප්‍රාදේශීය සභාව

සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම - 2016

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, ගලිගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා තිබෙන යම් ඉඩමක්, ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යය සඳහා හෝ නිත්‍ය විධිමත් ලෙස වගා කිරීමේ කාර්ය සඳහා යෝග්‍ය වන නමුත්, එසේ එම කාර්යයන් සඳහා එම ඉඩම යොදවා නැති අවස්ථාවක දී එකී ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් 2%ක් නොඉක්මවන වාර්ෂික බද්දක් 2016 වර්ෂය සඳහා පැනවීමට අදළ පහත යෝජනාව 2015.07.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ දී සභා සම්මත වූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුනේත්‍රා සමරසිංහ,
ලේකම්,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2015 අගෝස්තු මස 25 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා යෝජනාව

ගලිගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා තිබෙන යම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යය සඳහා හෝ නිත්‍ය හෝ විධිමත් ලෙස වගා කිරීමේ කාර්යය සඳහා යොදවා නැති අවස්ථාවක දී එකී ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් 2%ක වාර්ෂික බද්දක් 2016 වර්ෂය සඳහා පනවා අයකර ගැනීමට යෝජනා කරන්නී ය.

09-247/7

ගලිගමුව ප්‍රාදේශීය සභාව

පිඹුරු පිටපත් අනුමත කර ගැනීම 2016 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාර පැවරී ඇති බලතල අනුව පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2016 වර්ෂයේ දී අයකිරීම සඳහා පහත යෝජනාව 2015.07.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ දී සභා සම්මත වූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුනේත්‍රා සමරසිංහ,
ලේකම්,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා යෝජනාව

ගලිගමුව ප්‍රාදේශීය සභාව මගින් පිඹුරු පිටපත් අනුමත කිරීම සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2016 වර්ෂයේ දී පනවා අයකර ගැනීමට යෝජනා කරන්නී ය.

උපලේඛනය

	රු. ශත
පර්. 06-20 දක්වා	500 0
පර්. 21-30 දක්වා	700 0
පර්. 31-50 දක්වා	1,000 0
පර්. 51ට වැඩි සියලුම පර්චස් ප්‍රමාණයන් සඳහා	1,500 0

09-247/5

ගලිගමුව ප්‍රාදේශීය සභාව

ජල ගාස්තු අයකිරීම - 2016

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 114 වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව ජල ගාස්තු අයකර ගැනීමට 2015.07.29 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ දී සභා සම්මත වූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුනේත්‍රා සමරසිංහ,
ලේකම්,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2015 අගෝස්තු මස 25 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 114 වගන්තියට අනුව 2016 වර්ෂය සඳහා පහත උපලේඛනයේ සඳහන් පරිදි ජල ගාස්තු අයකිරීමට යෝජනා කරන්නී ය.

උපලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 114 වගන්තිය යටතේ
ජල ගාස්තු

ඒකක ගණන	*මුදල රු. ශත*
01. *ගෘහ ː*	
ස්ථාවර ගාස්තු	75 0
ඒකක 1-10	4 0
ඒකක 11-20	10 0
ඒකක 21-30	20 0
ඒකක 31-50	30 0
ඒකක 51 සිට	50 0
02. *ව්‍යාපාර ː*	
ස්ථාවර ගාස්තු	150 0
එක් ඒකකයකට	40 0

09-247/12

ගලිගමුව ප්‍රාදේශීය සභාව

පරිසර හා සෞඛ්‍ය අංශයේ ගාස්තු අයකිරීම - 2016

බලපත්‍ර ගාස්තු අංක 1534/18 හා 2008.02.01 දිනැති *ගැසට් පත්‍රයේ* 111 වන උපලේඛනයට (බලපත්‍ර ගාස්තු) මගින් දක්වා ඇත. ඒ අනුව,

01.	පරිසර ආරක්ෂණ බලපත්‍රය සඳහා		රු. 4,000 0	
02.	ජල බවුසරය සඳහා		රු. 3,500 0	
03.	ආදහනාගාරය ː	බල ප්‍රදේශය තුළ	රු. 6,000 0	
		බල ප්‍රදේශයෙන් පිටත	රු. 7,000 0	
04.	ගලිබවුසරය සීමාව තුළ	ගෘහස්ත	රු. 3,625 0	
		ව්‍යාපාරික	රු. 4,625 0	
	සීමාවෙන් පිටත	ගෘහස්ත	රු. 3,625 0	කිලෝමීටර් 1 කට රු. 80 00
		ව්‍යාපාරික	රු. 4,625 0	
05.	ජල බවුසරය ලෝඩ් 01 ප්‍රවාහනය සමඟ		රු. 3,500 0	

සුනේත්‍රා සමරසිංහ,
ලේකම්,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2015 අගෝස්තු මස 25 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා යෝජනාව

බලපත්‍ර ගාස්තු අංක 1534/18 හා 2008.02.01 දිනැති *ගැසට් පත්‍රයේ* 111 වන උපලේඛනය ප්‍රකාරව ඉහත සඳහන් ගාස්තුව පනවා අය කිරීමට 2015.07.29 දින මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව යෝජනා කරන්නී ය.

09-247/11

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.